## කුණ්ඩසාලේ ප්‍රාදේශිය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන, 2011 මාර්තු 31 උනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 සැප්තැම්බර් 11 දින සභාපතිවරයාට යවන ලදි.

### 1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කුණ්ඩසාලේ ප්‍රාදේශිය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) තාවකාලික මිශ්‍ර තැන්පත් යටතේ වූ රු.467,293 ක ශේෂයක් අදාල කාර්යන්ට යොදවා ඇතත් තව දුරටත් නොපියවූ තැන්පත් යටතේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ විශ්‍රාම වැටුප් හිඟ දායක මුදල වූ රු.417,948 ක් ගිණුම් වලින් සම්පූර්ණයෙන් අතහැර තිබීම නිසා එම ප්‍රමාණයෙන් වියදම් හා ණය හිමියන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) රු.3,233,869 ක් වූ දේශිය ණය හා සංවර්ධන අරමුදලේ ශේෂය නොදැක්වීම නිසා ණය හිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) සභාව සතුව පවතින ඉඩම් හා ගොඩනැගිලි විෂයයන් 151 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.10,727,344 ක් වූ අතර, උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගෙ එකතුව රු. 9,277,336 ක් විය.

(ඊ) 2011 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ස්වභාවයේ ගිණුම් වල හර ශේෂ එකතුව රු.15,766 ක් විය.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 226,454,393 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 28,157,554 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 13,140,122 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 1999 වර්ෂයේ සිට 2010 මාර්තු දක්වා සභාවේ තැන්පත් කලත් උපලබ්ධි නොවූ රු.376,000 ක් වටිනා චෙක්පත් 44 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මු. රෙ. 188 (2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ පවත්වාගෙන ගිය ජංගම ගිණුම් 02 කට අදාලව නිකුත් කොට මාස 06 ඉක්මවා ඇතත්, ගෙවීමට ඉදිරිපත් නොවූ රු.79,378 ක් වටිනා චෙක්පත් 05 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සම්මුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 23,444 | 17,428 | 8,644 |
| (ii) බදු කුලී | 10,450 | 3,377 | 2,488 |
| (iii)බලපත්‍ර ගාස්තු | 3,486 | 3,004 | - |
| (iv)වෙනත් ආදායම් | 24,720 | 25,428 | 3,081 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 1,032,209 |
| (ii) මුද්දර ගාස්තු | 15,361,798 |

2.3.3 කඩ කුලි

(i) 2007 වර්ෂයේදි සභාවේ කඩ කුලි සඳහා තක්සේරුවක් ලබා ගෙන තිබුණද එකී තක්සේරු වාර්තාව අනුව කුලි ගණනය නොකිරිම නිසා 2008 සිට 2011 වර්ෂය දක්වා කාල සීමාව තුළ සභාවට රු.3,381,600 ක පමණ අදායමක් අහිමි වී තිබුණි

(ii) මැණික්හින්න පොදු වෙළදපොලෙ උගන රණවිරු වීදිය, කිරිමැටිය හන්දිය හා බස් නැවතුම්පල කඩ කාමර බදු දීමේදි ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබු අතර 2011 දෙසැම්බර් 31 දිනට අය විය යුතු රු. 830,522 ක හිඟ මුදල් අය කර ගැනිමට ප්‍රමාණවත් ලෙස කටයුතු කර නොතිබුණි.

2.3.4 දැන්වීම් පුවරු ගාස්තු

2011 වර්ෂයේ දී සභා බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු වලින් ගාස්තු අයකර ගැනීමට අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

2.3.5 සම්ප්‍රේෂණ කුළුණු

නාගරික සංවර්ධන අමාත්‍යවරයාගේ 2009 අප්‍රේල් 17 දිනැති අංක1597/8 දරන අති විශේෂ ගැසට් නවේදනයේ 6 උප ලේඛනය ප්‍රකාරව,

(i) සභා සිමාව තුල ස්ථානගත කර තිබු සම්ප්‍රේෂණ කුළුණු 06 ක් සඳහා සැලසුම් අනුමත නොකර අනවසරයෙන් ඉදිකර තිබුණ අතර එම අනවසර කුළුණු සඳහා උස

---

සෑම මීටර් 5 කින්ම අයකල යුතු රු.10,000 බැගින් වූ ගාස්තු ගණනය කර අදාළ සමාගම් වලින් අයකර නොතිබුණ.

(ii) සභා බලප්‍රදේශයේ ස්ථාපිතකර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 12 ක් සඳහා සභාවට අයකර ගත යුතු රු.276,000 ක් වූ සංවර්ධන බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබුණි.

(iii) සභා බල ප්‍රදේශයේ පිහිටුවා ඇති සම්ප්‍රේෂණ කුළුණු 13 ක විකාශන ඇන්ටනා ප්‍රමාණය අනුව වාර්ෂික වෙළඳ බලපත්‍ර ලබා ගතයුතු වුවද, එසේ ලබා ගෙන නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට බලපත්‍ර ගාස්තු වශයෙන් රු. 272,000 ක මුදලක් අහිමි වී තිබුණි.

2.3.6 මස්කඩ බදු

--------------

සභාව සතු මස්කඩ, සමාලෝචිත වර්ෂයේදී බදු දීමේදි ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකර එකම පුද්ගලයකුට දිගින් දිගටම ලබා දී තිබුණි. 2011 දෙසැම්බර් 31 දින වන විට දිගන අංක 1 ගව මස් වෙළඳසැලේ හිඟ කුලිය රු.1,944,925 ක් විය. ඉතිරි මස් කඩ වල හිඟ මුදල් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.7,932,891 ක් විය.

(ආ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සංයුක්ත සැලසුම් හා ක්‍රියාත්මක සැලැස්මක් සකස්කර නොතිබුණි.

2.5 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

(අ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව පුස්තකාල සහායක හා මාර්ග කම්කරු තනතුරු 02 ක් පමණක් පුරප්පාඩුව පැවති නමුත්, 2011 වර්ෂයේදි අනියම් හා ආදේශකයන් 46 දෙනෙකු බඳවා ගෙන වැටුප් වශයෙන් රු.6,467,366 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි වැටුප් වශයෙන් රු.15,021,574 ක් ගෙවා තිබූ අතර, එයින් ප්‍රතිපූර්ණය වී තිබුණේ රු.13,747,497 ක් පමණකි.

3. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මුල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ණය ගැති හා ණය හිමි පාලනය

(ඊ) ගබඩා පාලනය